තුන්වෙනි ශ්‍රේණියේ දී පන්තියේ පළමුවැනියා වූ හැටි

රසික සූරියආරච්චි

තුන්වෙනි ශ්‍රේණියේ මා ගත කළ මුල් කාලය මට තරමක අභියෝගජනක එකක් වී යැයි කීම අතිශයෝක්තියක් නොවේ. එයට හේතු කිපයක්ම තිබුණි. ඒවා පිළිවෙලින් අත්වැඩ, චිත්‍රකර්මය සහ ප්‍රීතිකා සුබෝධිනී නම් වේ. ඉන් සමහර අභියෝග ජය ගැනීමට මම හැකි උපරිම උත්සාහය යෙදුවෙමි.

සමහර අභියෝග දෛවය විසින්ම විසඳන්නට යෙදුණි.

අත්වැඩ වනාහී මට මහා අභියෝගයක් විය. එය පාසලේ දී අපේ ගුරුවරිය අපට උගන්වන දෙයක් නොවේ. විභාගය පැවැත්වෙන දිනයේදී පහත සඳහන් කාර්යයන්ගෙන් එකක් හෝ කිපයක් කිරීම ලකුණු ලබා ගැනීමේ ක්‍රමයයි.

1. පොල් ලෙළි කිහිපයක් පොගවා තලා කොහු වෙන්කර ඉන් ලණු කැරල්ලක් ගොතා පාසලට ගෙන යාම.
2. හුඹස් මැටි වතුර සමග අනා ඒ මැටිටෙන් අඹ ගෙඩියක් හෝ පුහුලක සහිත කපු ගෙඩියක් හෝ රුවන්වැලි සෑයේ හෝ (එවකට) මිරිසවැටියේ හෝ අනුරුවක් අඹා වේලා පාසලට රැගෙන යාම.
3. සපත්තු පෙට්ටියකට ප්ලාස්ටික් නුල් රෝද දෙකක් හෝ හැකිනම් හතරක් ඉරටු ඇක්සල් සමග සවිකර පනෙල් සහ දොරවල් ඇඳ කපා විවර කර බස් රථයක ආකෘතියක් සාදා පාසලට ගෙන යාම.

මගේ අති මහත් උත්සාහය සාර්ථකයැයි හැඟෙන්නේ පන්තිය බාර හේමලතා ගුරුවරියගෙන් ලකුණු පනහක් හෝ හැටක් ලැබුණු විටය.

දෙවෙනි අභියෝගය වූයේ චිත්‍රකර්මයයි. චිත්‍රකර්මය විෂය ද ඉහත කී අත්වැඩ විෂයය මෙන්ම ගුරුවරුන් විසින් අපට උගන්වනු ලැබූ විෂය නිර්දේශයක් සහිත එකක් නොවීය. අපේ පන්තිභාර හේමලතා ගුරුවරිය කිසි දිනක චිත්‍රයක් ඇඳ අපට පෙන්වනු මගේ මතකයේ නැත. ඇය කරන්නේ අපට චිත්‍රයක් ඇඳිමට මාතෘකාවක් ලබා දී අප අඳිනා තුරු බලා සිටීමයි.
මේ සඳහා අපට නිරතුරු ලැබුණු මාතෘකා කිහිපයක් පහත පරිදි වේ.

1. චිත්ත මෝස්තරයක්
2. මුහුදු වෙරළක දර්ශනයක්
3. වැසි දිනයක දර්ශනයක්

එක්කෝ හොම්රන්පැස් නැතිනම් පාට පැන්සල් භාවිතා කරමින් අප සුදු පැහැති කොළ සහිත චිත්‍රපොත්වල බලිරූප ඇන්දෙමු.

සතියකට වරක් පමණ පැවැත්වෙන චිත්‍රකර්ම කාල පරිච්ඡේදය සමතික්‍රමණය කිරීම සරල එකක් විය. අප එදිනට නියමිත චිත්‍රය ඇඳ ගුරුවරියට පෙන්වූ විට හරි ලකුණක් වැටේ. නමුත් ප්‍රශ්නය වූයේ වාර විභාගයයි. වාර විභාගයේ දී නියමිත කාලය ඇතුලත අප අඳින චිත්‍රයට ලකුණු දිය යුතුය. හේමලතා ගුරුවරිය තුන්වැන්නේ මුල් වාර විභාගයේ දී මා ඇඳි චිත්‍රයට ලකුණු හැටක් ම දුන්නාය. මගේ තුන්වැනි අභියෝගය වූයේ ප්‍රීතිකා සුබෝධිනී ය.

ප්‍රීතිකා පියකරු දැරියකි. කොණ්ඩය කොටට කපා සිටියාය. ඇය අපේ හේමලතා ටීචර් ගේ නංගි ගේ දියණියයි.

මා දෙකේ පන්තියේ සිටියදී ප්‍රීතිකා සුබෝධිනී සිටින්නට අත්තේ අල්ලපු පන්තියේ ය. දෙකේ පන්ති දෙකකි. තුනේ පන්ති තුනකි. තුන්වැන්න සඳහා පන්ති බෙදද්දී ප්‍රීතිකා සුබෝධිනීත් මාත් එකම පන්තියට වැටී ඇත.

ප්‍රීතිකා සුබෝධිනී මගේ පන්තියේ සිටීමේ ප්‍රීතිය මට හරිහැටි වැටහුනේ පළමු වාර විභාගයේ ප්‍රතිපල සටහන් ලැබුණු දිනයේ ය.

ප්‍රීතිකා සුබෝධිනී පන්තියේ පළමුවෙනියා ය. මා දෙවෙනියා ය.

පළමුවෙනි ශ්‍රේණියේ අවසාන වාර විභාගයේ සිට මා පවත්වාගෙන ආ වාර්තාව බිඳ වැටී ඇත.

අම්මාට දුක හිතෙන්නටද ඇත.

මා දෙවන්නා වීමට හේතුව මඳක් විමසා බැලූ මගේ කුඩා මොලයට වැටහුනේ එහි කිසිදු පුදුමයක් නොමැති බවයි.

තුන්වැන්නේ දී අප උගත් සාමාන්‍ය විෂයයන් වන සිංහල, ඉංගිරිසි, ගණිතය, බුද්ධාගම, පරිසරය, ඉතිහාසය වැනි විෂයයන් සඳහා විභාගයේ දී ප්‍රශ්න දහයක් ලැබේ. ඒ සඳහා ලකුණු අනුවක් හෝ අසූවක් හෝ ගැනීම පහසු දෙයකි. එසේ නමුදු විභාග පැවැත්වීමේ හෝ ලකුණු දීමේ ක්‍රමවේදයක් නොමැති අත්වැඩ සහ චිත්‍රකර්මය විෂයන්ට මට ලැබී ඇත්තේ සාපේක්ෂව ඉතා අඩු ලකුණු විය.
කෙසේ හෝ මා පන්තියේ දෙවෙනියාය.

මා ඉදිරියේ ඇති මේ සියළු අභියෝග ජයගෙන යලිත් පන්තියේ පළමුවෙනියා වීමට ම අධිෂ්ඨාන කර ගත්තෙමි. ඒ ගැනැණු ළමයෙකුට දෙවෙනියා වීම ගැන තිබූ ලැජ්ජාවක් හෝ වෙනත් ඒ ආකාරයේ පුද්ගලික කරුණක් නිසා නොවේ. මගේ අම්මා සහ පුංචි අම්මලා පමණක් නොව සමස්ත ලෝක-යාම ළමයෙකුගේ ඉගෙනීමේ දක්ෂකම තීරණය කළේ පන්තියේ කී වැන්නාද යන්නෙන් වූ නිසාය. සාමාන්‍ය පෙළ වෙනතුරුම සිසුවෙකු ලබන ලකුණු ප්‍රමාණය හෝ ලබන සාමාර්ථ ශ්‍රේණිය හෝ ප්‍රශ්න නොකෙරිණි.

එකී අභියෝග සමතික්‍රමණය කර පන්තියේ පළමුවෙනියා වීමේ මගේ උත්සාහය අවසානයේ කෙසේ හෝ සඵල විය. ඒ මගේ උත්සාහයට වඩා ප්‍රීතිකා සුබෝධිනී ගේ අවාසනාව නිසා යැයි මට සිතේ.

ඒ කතාව කෙටියෙන් මෙසේය.

ඒ වසරේ මැද හරියේ අපේ කණිෂ්ඨ විද්‍යාලයට අළුතින් මුල් ගුරුවරයෙක් පත්වී ආවේය. දේශපාලන පත්වීමක් වූ ඔහු ගේ මුළුම රාජකාරිය වන්නට ඇත්තේ පාසල් සිසු සිසුවියන් ගේ උප්පැන්න සහතික පිරික්සීම විය යුතුයි. සමහරවිට ඔහු එසේ කරන්නට ඇත්තේ, අළුත නිකුත් කෙරුණු අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛනයක් නිසා විය හැකි ය. ඒ කෙලෙසක වුවත් එක් දිනක් අපේ පන්තියේ කෙටි තාප්පයට එහායින් පැමිණ හේමලතා ගුරුවරිය කැඳවූ මුල් ගුරුවරයා අසල සිටි අප කිහිප දෙනෙකුටද ඇසෙන පරිදි පවසා සිටියේ අපේ පන්තියේ නියමිත වයසට වඩා අඩු වයසක සිසුවියක් සිටින බවත් ඇයට පහල පන්තියට යාමට සිදුවෙන බවත්ය.

ඒ අවාසනාවන්ත සිසුවිය වූයේ ප්‍රීතිකා සුබෝධිනී ය.

ප්‍රීතිකා සුබෝධිනී පසු දිනම දෙවෙනි ශ්‍රේණියේ මගේ සොහොයුරා ඉගෙන ගත් පන්තියට ගියාය. එහිදී වාර විභාගයෙන් තෙවෙනියා වූවාය.

මම කිසිදු අතුරු ආන්තරාවකින් තොරව තුනේ පන්තියේම වැඩ වාසය කරමින් පන්තියේ පළමුවැනියා ලෙස හතරේ පන්තියට සමත් වුණෙමි.

පුවටන පිටෙන්

සුද්දෙ ඉවරවෙනකොට දෙලක්ෂයකට ආවා. ඒ දෙලක්ෂයෙනුත් 25 000ක් විතර හිටියේ ආබාධිත වෙච්ච අයයි. රාජකාරියට හිටියේ 1 75 000යි. සුද්ධය තියන කාලේ මේ සෙබළු නොකා නොබී, නිදිවරාගෙන, හිටාඩු යන්නේ නැතිව, පුහුණුවීම්, විවේක ගැනීම් නැතිව වැඩකළා. සුද්ධය ඉවර වුණාම මේ අයටත් හිටාඩු යන්න දෙන්න ඕනේ. පුහුණුවීම් දෙන්න ඕනේ. මේවට අමතර බල සෙනග ඕනේ. සාමාන්‍යයෙන් ඕනෙම හමුදාවක හතරෙන් එකක සෙනගක් ඉන්නවා රාජකාරියෙන් තොරව ඒ දේවල්වලට. ඒ ඔක්කොම ගණන් හදලා බලලා තමයි මම කිව්වේ තව 80 000ක් හමුදාවට අවශ්‍යයයි කියලා. ඒ 80 000 දුන්නා නම් යුද්ධයෙන් පසුව පැනලා ගියපු 65 000 අද තවම හමුදාවේ ඉන්නවා. ඕක තමයි හමුදාවට අමතර බල සෙනග ඕනේ කියන්න හේතුව. නමුත් ඒක කරපු හින්දා රට පාලනය කරන ආරක්ෂක ඇමැති විදේශ රටවලට ගිහිල්ලා ලැජ්ජා නැතුව කිව්වා මේ හමුදාපති ඉන්දියාවට පහර දෙන්න වැඩිපුර සෙනග බන්දව ගන්න ඕනේ කිව්වා කියලා. කොච්චර හින්දිත, ද්‍රෝහි කතාවක්ද ඒ. තමන්ගේ හමුදාපති එහෙම දෙයක් කිව්වා නම් ඒක වෙනින් රටකට දුවලා ගිහිල්ලා කියනවද මේ හමුදාපති ඉන්දියාවට පහර දෙන්න හදනවා කියලා.
අනික තමයි ෆීල්ඩ් මාර්ෂල් කෙනෙක් වෙන්න ඕනෙයි කිව්වා කියලා. ෆීල්ඩ් මාර්ෂල් වෙන්නේ හමුදාවෙන් විශ්‍රාම ගිය අය. ඒක ඔනරරි රැන්ක් එකක්. විශ්‍රාම යනවෙලාවට තමයි ඒක දෙන්නේ. හමුදා සේවයේ ඉන්න අය ෆීල්ඩ් මාර්ෂල්ල වෙන්නේ නෑ. තරු හතරේ ජේනරල්ල තමයි හමුදාවේ ඉන්නේ. ඔය මෝඩ කතා කියන අයට ඕවා ඉගෙන ගන්න කියන්න.

හමුදා සේවයේ සිටියදී ලබාදිය හැකි ඉහළම නිලය, තරු හතරේ ජේනරාල් නිලය ඔබට ලබාදුන්නා?
මට තරු හතරේ ජේනරල් එකක් දුන්නා තමයි. නමුත් අපේ හමුදාවේ හිටිය හැම හමුදාපති කෙනෙක්ම විශ්‍රාම යන දවසේ තරු හතරේ ජේනරල්ල වෙලා තමයි ගියේ. මට විශ්‍රාම යන්න මාස දෙකකට කලින් ඒක දුන්න එක යුද්ධය දිනුව නිසා දුන්න දෙයක් කියලා ඒගොල්ල පෙන්නන්න හැදුවට ඒක ලොකු දෙයක් නෙවෙයි. අනිත් එක තමයි ලෝකේ වෙන ඕනේම රටක නම් ඔය වගේ යුද්ධයක් දිනුව හමුදාපති කෙනෙක් ෆීල්ඩ් මාර්ෂල් කෙනෙක් කරනවා. හමුදාපතිට විතරක් නෙවෙයි නාවික හමුදාපති, ගුවන් හමුදාපතිටත් දෙනවා ෆීල්ඩ් මාර්ෂල් තනතුරට සමාන තනතුරු. එතනත් බොරුව මේ අය කළේ. උසස්වීම් දීලා මාස හතරෙන් හමුදාපතිවරු සියලු දෙනාම අයින් කළා. ඒකත් කුහක වැඩක් තමයි ඒ කළේ.

රටක හමුදා බලය වැඩිවීම, හමුදා නායකයන් දේශපාලන නායකත්වයට පත්වීම කියන කාරණා ඒ රටේ සිවිල් සමාජය බිඳවැටීමට හේතුවනවා නේද? දැන් ඔබ සිවිල් දේශපාලන නායකයෙක් විදිහට ඒ ගැන දරන අදහස්පය මොකක්ද?
ලෝකයේ හමුදාපතිවරු, ජෙනරල්ලා ජනාධිපතිවරු වුණ වැඩිම රට අමෙරිකාව. එක ජෙනරල්වරයෙක් හමුදා හිල අදුලමේ ඉදගෙන ජනාධිපතිවරණයට තරඟ කළා. දිනුවට පස්සේ හිල අදුලම ගලවල තියලා ජනාධිපති පුටුවේ වාඩි වුණා. අද අැමරිකාවේ සිවිල් සමාජය බිඳවැටිලද? ප්‍රංශයේ ජෙනරල්ලා අගමැතිවරු වුණා. ඒ රටේ සිවිල් සමාජය බිඳවැටුණද? මම ගිතන්නේ ප්‍රංශයේ තියෙන්නේ ලෝකයේ හතරවෙනි ශක්තිමත් ආර්ථිකය. හිටිලර්ලු, ඉඩි අමින්ලා හමුදාපතිවරුවත්, ජෙනරල්ලවත් නෙවෙයි. ඉඩි අමීන් කියන්නේ ඒ රටේ හමුදාවේ හිටපු කෝකියෙක්. හිටිලර් කියන්නේ පළවෙනි ලෝක යුද්ධයේදී හමුදාවේ හිටිය සාමාන්‍ය සෙබළෙක්. ඒගොල්ලෝ දේශපාලනයට ඇවිල්ලා ඉහළට ගිහින් පසුව තමයි ජෙනරල් කියලා තරු පටි ගහගත්තේ. ඇත්තටම ජෙනරල්ලා කියන්නේ මනුෂ්‍යයන්ගේ අවශ්‍යතා තේරුම්ගත්ත, පරිපාලනයේ නිපුණත්වයට පැමිණි, තමා යටතේ ඉන්න අයගේ සුඛ ශාන්තය ගැන නිපුණත්වයට පැමිණි පිරිසක්. ඇත්ත ජේනරල්ලා ජනාධිපතිවරුවෙලා ලෝකයේ කොධිම රටක්වත් විනාශ කරලා නෑ. අපි යුද්ධ කරන කාලේ රටේ මිනිස්සුන්ගෙන් පළිගන්නද? හමුදා ශක්තිය තිබුණා කියලා මිනිස්සුන්ට හිරිහැර කළාද? මම ජෙනරල් කාලේ මේ රටේ මිනිස්සුන්ට හිරිහැර කරලා, අපරාධ කරලා, වැඩියෙන්ම ජනතාව හූරා කෑවේ ජෙනරල්ලද දේශපාලනඥයෝද? ඕක තමයි ඇත්ත තත්ත්වය. අනිත් එක මටනේ කිව්වේ ජෙනරල්කෙනෙක් හිටිලර්වගේ වෙයි, ඉඩි අමින් වගේ වෙයි කියලා. එතකොට මට විරුද්ධව දේශපාලනය කරපු පුද්ගලයා, පුද්ගලයෝ බෝධිසත්වයෝ වගේ මිනිස්සුද? එතකොට ලෝකයේ මොන රටේද බෝධිසත්වයෝ එකතුවෙලා හිටිලර්ව හිරේ දැම්මේ. එතකොට හිරබත් කන්නේ හිටිලර්. හිටිලර්ව හිරේ දාන්නේ බෝධිසත්වයෝ.

ඔබගේ දේශපාලන විරුද්ධවාදීන් දිගින් දිගටම ඔබව හුවාදක්වන්නේ කළගුණ නොදන්නෙක් විදිහට. කළගුණ සැළකීම කියන්නේ දේශපාලන කාරණයක් නොවෙයි. ආචාර ධර්මීය කාරණයක්. නමුත් මේ රටේ ජන සමාජය එවැනි දේ ගැන දක්වන සංවේදීතාවය වැඩියි. මේ කාරණය ගැන මොකක්ද ඔබ කියන්නේ?
මේ රටේ අවුරුදු තිහක යුද්ධය ඉවර කරපු හමුදාපතිට බොරු චෝදනා දාලා, මේජර් ජෙනරාල්ල හතර දෙනෙක් නඩු අහන්න දාලා, හමුදා රෙගුලාසිවලට විරුද්ධව බොරු උසාවියක් හදලා ඒ ජෙනරාල්ගේ තරු ගරු තම්බුනාමවලට විතරක් නෙවෙයි විශ්‍රාම වැටුපටත් ගහපු මිනිස්සු කළ කෙලෙහිගුණ සැළකිල්ල මොකක්ද? ඉස්සෙල්ලා ඒකට උත්තරයක් දෙමුකො. මම කෙලෙහි ගුණ සැළකුවේ නෑ කියන්නේ මම හමුදාපතිකරපු හින්දා ඒකට කෙලෙහි ගුණ සළකන්නේ නැතිව ගිහින් ජන්දේ ඉල්ලුවා කියලනේ. මේ රටේ දැන් තියන ඔක්කොම පත්තිරිමි දේශපාලන පත්තිරිමිනේ. ඒ පත්තිරිමිකින් ඉහළ තනතුරකට පත්වුණ කෙනෙකුට දේශපාලනය කරන්න අවස්ථාවක් නැහැ කියන එකද මේ කියන්නේ. අපි හිතමු අග විනිසුරු, හමුදාපති, මහ බැංකුවේ අධිපතිවරුගේ අය ගැන. ඒ පත්තිරිමි කළ පුද්ගලයා කොච්චර දූෂිත කෙනෙක් වුණත් එයාට විරුද්ධව කතා කරන්න අයිතියක් නැත්ද? එතකොට කෙලෙහි ගුණ සළකනවා කියන්නේ අර මිනිහා කොච්චර දූෂිත පුද්ගලයෙක් වුණත් ඒ මිනිහා එක්ක එකතුවෙලා අපිත් දූෂණවල යෙදෙන එකටද?

ඔබ අපේක්ෂා කරන දේශපාලන වෙනස කරන්න බලය ලැබුණොත් ඔබ මුලින්ම අත තියන කාර්යය මොකක්ද?
එකක් නෙවෙයි කරුණු කීපයක් තියනවා. දූෂණය නැතිවෙන්න ඕනේ. අයුක්තිය අසාධාරණය නැතුව ජනතාවට ජීවත්වෙන්න පුළුවන් වෙන්න ඕනේ. මානුෂීය අයිතිවාසිකම් රැකෙන්න ඕනේ. ප්‍රජාතන්ත්‍රවාදය රැකෙන්න ඕනේ. අධිකරණයේ ස්වාධීනත්ය රැකෙන්න ඕනේ. ඒ වගේ මුලින්ම කළ යුතු දේවල් ගොඩක් තියනවා. අපි හැමදාම කියන දෙයක් විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කිරීම. ඒකත් අත්‍යාවශ්‍යයෙන්ම සිදුවෙන්න ඕනේ.

ඔබට මේ වෙනස්කම් කරන්න සැබෑ අවශ්‍යතාවක් තියනවා වෙන්න පුළුවන්. ඒත් ඒ සඳහා වන දේශපාලන ගමන ඔබට යන්න වෙලා තියෙන්නේ දේශපාලන වශයෙන් අපකීර්තිමත් ඉතිහාසයක් තියන පුද්ගලයන් සමගයි. ඔබ බලයට පත්වන යම් අවස්ථාවක ඔබව වටකරගන්නවා ඇත්තෙත් ඒ සමූහයමයි. එවැනි පසුබිමක ඔබේ අරමුණ ජයගන්න පුළුවන් වෙයිද?
මම 2010 ජනාධිපතිවරණය දිණුව නම් ඔබ ඔය කියන විදිහට මාව වටකරගන්නේ ඒවගේ අය තමයි. නමුත් දැන් මම ඉවසීමෙන් මේ ගමන යන්නේ. මේක වෙනස් කරන්න නම් හොඳ චරිත ඉන්න ඕනේ කියන එක මට තේරිලා තියනවා. ඒ චරිත සොයාගැනීමේ ක්‍රියාදාමයක තමයි මම මේ දවස්වල යෙදිලා ඉන්නේ. අපිට ජන්ද තියනවා. ජනතාව ඉන්නවා. ඒ නිසා නායකත්වය සඳහා පළාත් මට්ටමෙන් දිස්ත්‍රික් මට්ටමෙන් හොඳ චරිත සොයාගැනීම තමයි දැන් මම කරගෙන යන්නේ.

යුද්ධය ජයගත්තත් යුද්ධයට පසුවම නිර්මාණය වූ ගැටළුවලට මෙතෙක් දේශපාලනමය විසඳුම් ලබාදී නැහැ. උතුරු නැගෙනහිර දෙමළ ජනතාවගේ ප්‍රශ්නයට ඔබ යෝජනා කරන විසඳුම් කවරා ආකාරයේ ඒවාද?
මම කියන්නේ රටේ හැමෝටම එක හා සමානව ආත්ම ගෞරවය රැකගෙන ජීවත්වෙන්න පුළුවන් වෙන්න ඕනේ. දැන් ඔය එක එක විසඳුම් ඉල්ලන්නේ ඔය කාරණය ඉෂ්ටවෙන්නේ නැති නිසයි. අපේ ආත්ම ගෞරවයයි අපේ ආරක්ෂාවයි තියෙන්න ඕනේ කියන එකනේ කියන්නේ. ඕකනේ අවශ්‍යය. එතකොට ලෝකයේ රටවල් ගොඩක් තියනවා විවිධ ජාතීන් ජීවත්වෙන. ඒ හැමතැනම ආත්ම ගෞරවය රැකුණේ ආරක්ෂාව රැකුණේ මානුෂීය අයිතිවාසිකම් රැකුණේ බලය බෙදීමෙන්ද, එහෙම නැත්නම් ජනතාව එකමුතුවෙලා ජීවත්වෙන්න ඕනේ කියලා තේරුම් අරගෙන කටයුතු කළ නිසාද? ඔය නොයෙක් බලය බෙදීම් කරලා එක එක විදිහට ව්‍යවස්ථාව වෙනස් කළත් අපි දකුණේ ජනතාවයි උතුරේ ජනතාවයි සහෝදර බැම්මෙන් ජීවත්වෙන්න ඕනේ කියන එක තේරුම් ගන්නකන්, එකට ජීවත්වෙලා උතුරේ ජනතාවටත් අසාධාරණයක් නොවෙන්න දකුණේ ජනතාව ජීවත්වෙන්න ඕනේ, දකුණේ අයගේ හිත නොරිදෙන්න, සැකයක් ඇති නොවෙන්න උතුරේ අය ජීවත්වෙන්න ඕනේ. මේ සංගිඳියාව එනකන්, මේක යථාර්ථයක් වෙනකන් වෙන මොනවා කළත් ප්‍රශ්නයට විසඳුම එන්නේ නෑ. යුද්ධයෙන් බැට කකා අවුරුදු තිහක් ජීවත් වුණ නිසා එකට ජීවත්වෙන්න පුරුදු වෙන්න ටික කලක් යන්න ඉඩ තියනවා. ඊට පස්සේ උතුරේ ජනතාවට මොනව දුන්නත් දකුණේ ජනතාව කෑගහන එකක් නෑ. දෙගොල්ල අතරේ සැකයක් හෝ වෛරයක් ඇතිවෙන එකකුත් නෑ. අමෙරිකාවේ ඉස්සර කළු සුදු භේදය තදින්ම තිබුණා. දැන් කළු ජාතිකයෙක් ජනාධිපතිවෙලා ඉන්නවා. ඒ තැනට මේ රට ගෙන යා යුතුයි. ඊට පස්සේ බලය බෙදන දේවල් ඒවා මේවා ලොකු දේවල් හැටියට කවුරුත් සළකන එකකුත් නෑ. ඕනෙනම් කරන්නත් පුළුවන්වෙයි. ඕගේ නැත්නම් නොකර ඉන්නත් පුළුවන් වෙයි.

සංවාදය සහ ඡායාරූප
ශ්‍රීලාල් සෙනෙවිරත්න